# පර්යන්ත ප්‍රදේශ සංවර්ධනයේ දී සේවා මධ්‍යස්ථානයන්හි කාර්යභාරය; හටංගල ග්‍රාමීය ජනාවාසය ඇසුරින්

**ඩී. කේ. ඩී. ඒ. රණවීර සහ අර්. එම්. කේ. රත්නායක**
**භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***ratnayake.rmk@gmail.com***

ශ්‍රී ලංකාවේ බහුතරයක් වන ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනය කිරීම මුඛ්‍ය පරමාර්ථය වන අතර එහිලා කාලය, අවකාශය හා සංස්කෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශවල සියලු මානව සම්පත් සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. එමගින් ප්‍රජා සේවා, සමාජ-ආර්ථික යටිතල පහසුකම්, නේවාසික, කර්මාන්ත හා ශිල්පීය ක්‍රම හා කෘෂිකාර්මික සංවිධාන ගත ක්‍රියාකාරකම් සහිත සංවර්ධනයක් අපේක්ෂා කළ හැකිය. මෙහිදී අවධානය යොමු කළ යුතු භෞතික, තාක්ෂණික, ආර්ථික, සමාජ, සංස්කෘතික හා ආයතනික සාධක අතර පවතින්නා වූ අන්තර් ක්‍රියාකාරීත්වය සංවර්ධනමය දෘෂ්ටි කෝණයකින් විමසා බැලීම වඩා වැදගත් වේ. මෙවැනි වූ ග්‍රාමීය සංවර්ධනයක් උදෙසා අවශ්‍යවන පහසුකම් සැපයීමේ ප්‍රධානම මූලය වන්නේ සේවා මධ්‍යස්ථානයි. ශ්‍රී ලංකාවේ නිල වශයෙන් පිළිගත හැකි නාගරික සේවා මධ්‍යස්ථාන මෙහිදී වැඩි කාර්යභාරයක් සිදු කරනු ලබන අතර නාගරික වශයෙන් පිළිනොගැනෙන එහෙත් ග්‍රාමීය සංවර්ධනය සඳහා ඍජුවම සම්බන්ධ වන්නා වූ ග්‍රාමීය සේවා මධ්‍යස්ථාන ද වැදගත් මෙහෙයක් සිදු කරයි.

මෙවැනි වූ සේවා මධ්‍යස්ථානවලින් ඊට අදාළ වන්නාවූ ග්‍රාමීය පර්යන්තය සඳහා අවශ්‍ය සේවා සැපයීම, නිෂ්පාදන සඳහා අවශ්‍ය යෙදවුම් හා ඒ සඳහා වෙළඳපල සැපයීම මේ අතුරින් ප්‍රධාන වේ. ඊට අමතරව මූල්‍ය, අධ්‍යාපන, පරිපාලන සේවා සැපයීමේ දී ප්‍රධාන කාර්යභාරය ඉටු කරනු ලබන්නේ මෙවැනි වූ සේවා මධ්‍යස්ථාන මගිනි. එලෙස සේවා සැපයීමේ දී සේවා මධ්‍යස්ථානයේ සිට ක්‍රමයෙන් ඈතටයත්ම සේවා සැපයීමේ අඩුවීම මත පර්යන්තයට කරනු ලබන බලපෑමද ක්‍රමානුකූලව අඩු වේ. පර්යන්තයෙන් ඈත්වත්ම සිදුවෙන්නා වූ මෙවැනි බලපෑම් පර්යන්ත කෙළවරෙහි පිහිටි ඇතැම් ප්‍රදේශ හුදෙකලා කරවීමට හේතුවන අතර එවැනි ප්‍රදේශයන්හි සංවර්ධනය ඉතා මන්දගාමී ස්වරූපයක් ගනු ලබයි. සේවා මධ්‍යස්ථාන ධූරාවලියේ ඉහළ මට්ටමේ පවතින නාගරික සේවා මධ්‍යස්ථානයක් හා එම සේවා මධ්‍යස්ථානයෙන් පෝෂණය වන්නා වූ පහළ ගණයේ ග්‍රාමීය කුඩා සේවා මධ්‍යස්ථානයක පර්යන්තයේ පිහිටි සේවා ලැබීම් අතින් පහළම මට්ටමේ පවතින ග්‍රාමීය ප්‍රදේශයක් මෙම අධ්‍යයනය කෙරෙහි ඉලක්ක විය. බලංගොඩ නිල නාගරික මධ්‍යස්ථානය සහ වැලිගෙපොල කුඩා සේවා මධ්‍යස්ථානයෙන් ආවරණය වන හටංගල ගම මේ සඳහා තෝරා ගන්නා ලදී.

මේ සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමේ දී පර්යන්ත අන්තයේ සිට මේ දෙස බලා අවශ්‍ය දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කිරීමට සිදු කරනු ලැබිණ. දත්ත රැස් කිරීමේ දී ද්විතියික දත්ත මෙන්ම වැඩි වශයෙන් ප්‍රාථමික දත්ත භාවිතා කරන ලදී. ඒ අනුව ප්‍රශ්නමාලාවක් ඉදිරිපත් කිරිම, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා නිරීක්ෂණ ක්‍රමවේදයන් මෙන්ම

සිද්ධි අධ්‍යයන යොදා ගන්නා ලදී. එම දත්ත විශ්ලේෂණය ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් සිදු කරන ලදී.

නාගරික මධ්‍යස්ථානයේ සිට 20 km ක් පමණ ඈතින් පිහිටි භෞතිකමය වශයෙන් විෂම බවක් සහිත කෘෂිකර්මාන්තය මත ජීවිකාව ගෙනයන මෙම ග්‍රාමයේ සංවර්ධනයට ප්‍රධානම බාධකය වී පවතින්නේ ප්‍රවාහන පහසුකම් අවම වීම, නිෂ්පාදන සඳහා වෙළඳපොළ නොමැති වීම හා අතරමැදි ග්‍රහනයට නතුවීම යන්න අධ්‍යයනයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පද:*** *නාගරීකරණය, නාගරික පර්යන්තය, ග්‍රාමීය සංවර්ධනය, ග්‍රාමීය සේවා මධ්‍යස්ථාන*